**ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 06 දින බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, වානිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 8,559.05 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 6,898.74 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,660.31 ක් හෙවත් සියයට 19.40 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 5,319.05 | 4,792.33 | 526.72 | 9.90 |
| මූලධන | 3,240.00 | 2,106.41 | 1,133.59 | 34.99 |
| **එකතුව** | **8,559.05** | **6,898.74** | **1,660.31** | **19.40** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 20.01.04.00 සඳහා රු.මිලියන 50.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 51.03 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 102.06 ක ප්‍රමාණයක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.01.04.00 | 50.00 | 51.03 | 1.03 | 2.06 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 140.00 | 135.53 | 125.00 | 128.08 | 400.00 | 272.87 |

### 2.3.2 වාණිජ අත්තිකාරම් ගිණුම

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු විෂය අංක 23202 දරන බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 100.00 | 96.96 | 125.00 | 150.87 | 62.00 | 19.12 | 12.00 | 4.15 |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

විෂය අංක 23202 දරන බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | ලාභය කල්පිත ගාස්තු රහිතව | පාඩුව කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | පාඩුව කල්පිත ගාස්තු සහිතව |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු | 63.07 | 10.34 | 50.80 | 9.51 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම් දෙකක ශේෂ එකතුව රු.මිලියන 8.17 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 7002/0000/00/0078/2016/000 | 0.18 |
| 7002/0000/00/0079/2016/000 | 7.99 |
| **එකතුව** | **8.17** |

## 2.5 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 07 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 300.72 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0016/000 | 1.08 |
| 6000/0000/00/0002/0017/000 | 3.67 |
| 6000/0000/00/0006/0028/000 | 2.31 |
| 6000/0000/00/0006/0018/000 | 3.92 |
| 6000/0000/00/0016/0062/000 | 286.64 |
| 6000/0000/00/0018/0075/000 | 2.10 |
| 6000/0000/00/0013/0125/000 | 1.00 |
| **එකතුව** | **300.72** |

## 2.6 විගණන නිරීක්ෂණය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 02 කට 2017 අගෝස්තු 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.15,778,078 ක් විය.

## 3.3 විසර්ජන ගිණුම

-----------------

**අයවැය විචලනය**

--------------------

දෙපාර්තමේන්තුව විසින් පිලියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම නිසා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වැය විෂයයන් 4 කට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 37 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-------------------------------------------------------------------

විෂය අංක 23201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2016 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.7,328,320 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පොත් අනුව හා භාණ්ඩාගාරයේ පොත් අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.90,268 කින්ද, එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය හා දෙපාර්තමේන්තු පොත් අනුව කේවල ශේෂ එකතුව රු.923,842 කින්ද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය හා භාණ්ඩාගාර පොත් අනුව කේවල ශේෂ එකතුව රු.833,574 කින්ද වෙනසක් පැවතියද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වෙනස්කම් සසදා නිවැරදි කර නොතිබුණි.

(ඇ) වතුපිටිවල බන්ධනාගාරය වසා දැමීමෙන් පසුව ඒ වන විට එහි සේවය කළ සේවකයින් හා නිලධාරීන් 28 දෙනෙකුගේ රු.168,183 ක ණය ශේෂ අදාළ සේවකයින් හෝ නිලධාරීන් ඉන් පසුව අනුයුක්ත කළ ස්ථානවලට පවරා දීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය ශේෂ හිඟහිටව පැවැතුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට සේවය හැර ගිය සේවකයින් හෝ නිලධාරීන් 17 දෙනෙකු ගෙන් අයවිය යුතු රු.32,176 ක්ද, විශ්‍රාම ගිය සේවකයින් හෝ නිලධාරීන් 8 දෙනෙකු ගෙන් අයවිය යුතු රු.113,363 ක්ද හා සේවයේ යෙදී සිටින සේවකයින් හෝ නිලධාරීන් 3 දෙනෙකුගෙන් අයවිය යුතු රු.22,303 ක්ද වශයෙන් වූ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.5 වාණිජ අත්තිකාරම් ගිණුම

-----------------------------

විෂය අංක 23202 දරන බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ වානිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂය සඳහා වූ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කළ අතර ඉකුත් වර්ෂය සම්බන්ධයෙන් විගණන මතයක් ප්‍රකාශ කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.3,595,980 ක ණය හිමියන් හා රු.554,351 ක උපචිත වියදම් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2016 ජනවාරි 01 දිනට රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් අයවිය යුතු රු.මිලියන 63.79 ක ණයගැති ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 22.36 ක් පමණක් අයකර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අංශයෙන් අයවිය යුතු රු.මිලියන 63.19 ක ණයගැති ශේෂවල උපලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර ශේෂ සනාථ කර ගැනීම් ලබා ගෙනද නොතිබුණි. එසේම එම ණයගැති ශේෂය තුළ වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.මිලියන 8.95 ක්ද, වර්ෂ 5 ක සිට වර්ෂ10 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන එකතුව රු.මිලියන 4.13 ක්ද හා වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන එකතුව රු.මිලියන 28.39 ක්ද , සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) බන්ධනාගාර නේවාසිකයින් පුනරුත්ථාපනය කිරීමෙන් ඔවුන් සමාජයට යැවූ පසු නැවතත් වැරදි කිරීමෙන් වලක්වා ගැනීමත්, බන්ධනාගාර ගතව සිටින කාලය තුළ ඔවුන්ට නොයෙකුත් අංශ මගින් වෘත්තීය පුහුණුවක් ලබාදීමත් යන මෙම අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අරමුණු ඉටුකර ගැනීමට හැකි වන පරිදි හඳුනාගත් ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ඒ වෙනුවට ඇස්තමේන්තු ගත අයවැය ලේඛනයක් පිළියෙල කර එය ක්‍රියාකාරී සැලැස්ම ලෙස නම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී බන්ධනාගාර ආයතන 06 ක් තුළ ස්ථාපිත වැඩ අංශ 08 ක කිසිදු නිෂ්පාදනයක් සිදු කර නොතිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, අත්තිකාරම් ගිණුම් කටයුත්තේ ගනුදෙනු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

(ඊ) අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළ බන්ධනාගාර ආයතන 15 ක ක්‍රියාකාරී සැලැස්ම නමින් හඳුන්වා තිබුණු සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අවස්ථා 12 කදී සංශෝධනය කර තිබුණි. අවසන් සංශෝධනයට අනුව ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම සැසඳීමේදී බන්ධනාගාර ආයතන 07 ක ආදායම රු.මිලියන 18.15 කින් වැඩිවී තිබුණු අතර බන්ධනාගාර ආයතන 05 ක ආදායම රු.මිලියන 2.74 කින් අඩුවී තිබුණි. එම සංශෝධනයට අනුව ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම සැසඳීමේදී බන්ධනාගාර ආයතන 07 ක මුළු වියදම රු.මිලියන 16.73 කින් වැඩිවී තිබුණු අතර බන්ධනාගාර ආයතන 03 ක වියදම රු.මිලියන 1.52 කින් අඩුවී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.6 පොදු තැන්පත් ගිණුම

----------------------

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.59,938 ක්වූ තැන්පත් ගිණුම් ශේෂයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

-----------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

පහත සඳහන් පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව, සවි කිරීමට නියමිත යන්ත්‍ර සඳහා පරමාණුක බලශක්ති නියාමන සභාවෙන් අනුමැතිය ලබා නොගෙන සහ යන්ත්‍ර ස්ථාපිත කිරීමට අවශ්‍ය ගොඩනැගිලි ඉඩ පහසුකම් සලසා ගැනීමෙන් තොරව රු.මිලියන 19.47 ක් හා රු.මිලියන 2.66 ක් වැයකර පිළිවෙලින් පුද්ගල පරීක්ෂා කිරීමේ යන්ත්‍රයක් හා පාර්සල් පරීක්ෂා කිරීමේ යන්ත්‍රයක් 2015 ජූලි 07 දින මිලදී ගෙන මහර බන්ධනාගාරය වෙත නිකුත් කර තිබුණි. පුද්ගල පරීක්ෂා කිරීමේ යන්ත්‍රය මාස 06 කට අධික කාලයක් ද, පාර්සල් පරීක්ෂා කිරීමේ යන්ත්‍රය මාස 20 කට අධික කාලයක්ද නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ii) පාර්සල් පරීක්ෂා කිරීමේ යන්ත්‍රය මගින් 2017 ජනවාරි 10 දින වන විටත් කිසිදු තහනම් ද්‍රව්‍යයක් අනාවරණය කර ගැනීමට නොහැකිව තිබුණු බැවින්, යන්ත්‍රය මගින් පරීක්ෂාවට භාජනය කරනු ලබන සියලු පාර්සල් හා භාණ්ඩ අනිවාර්යයෙන්ම අතින් පරීක්ෂා කිරිමට නිලධාරීන්ට සිදුවී තිබුණි. මෙම තත්ත්වය පිළිබඳව දෙපාර්තමේන්තුව වෙත මහර බන්ධනාගාරය විසින් වාර්තා කර නොතිබුණි.

3.8 **බේරුම් නොකළ බැරකම්**

---------------------------

දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.මිලියන 359.76 ක් වී තිබුණි. මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 14.99 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.9 අනුකූල නොවීම්**

-----------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 103, 104, 105 හා 156 | දෙපාර්තමේන්තුව සතු මෝටර් රථයක් 2013 මාර්තු 11 දින හදිසි අනතුරකට භාජනය වී තිබුණු නමුත්, ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකිරීමට හෝ අලාභ හානි වටිනාකම තක්සේරු කිරීමට හෝ වගකිව යුතු පාර්ශවවලින් අයකර |

| | | |
|---|---|---|
| | | ගැනීමට හෝ කටයුතු නොකර පාවිච්චියෙන් ඉවත්කර තිබුණි. |
| (ii) | මුදල්රෙගුලාසි 237 (ආ) | 2016 දෙසැම්බර් 31 දින වන විට අදාළ සැපයුම්කරුවන් විසින් ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාදී නොතිබුණත්, මහර බන්ධනාගාරයේ ගෙවීම් සහතික කළ නිලධාරියා විසින් සහතික කළ ගෙවීම් වවුචර් 04 ක් සඳහා මුදල් රෙගුලාසි 237 ට පටහැනිව රු.1,697,645 ක් ගෙවා තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 753(i)(ii) | මහර බන්ධනාගාරය විසින් විධිමත්ව බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණු අතර බන්ධනාගාරයේ එක් එක් ශාඛාවන් විසින් උප බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි. ඒ අනුව ශාඛාවලට නිකුත් කළ භාණ්ඩද ගබඩාවේ පවතින භාණ්ඩ ලෙස පවතින අතර අපහරණය කර ඉවත් කරන භාණ්ඩ පමණක් බඩු ලේඛන පොතේ නිකුත් කිරීම් ලෙස ඇතුළත් කර තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 1645 හා 1647 (ඉ) | මහර බන්ධනාගාරය සතුව මෝටර් වාහන 25 ක් පැවති නමුත් මෝටර් වාහන ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. වාහන ලොග් පොත් යාවත්කාලීන කර හෝ අධීක්ෂණ නිලධාරී විසින් පරීක්ෂා කර හෝ නොතිබුණි. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මහර හා මාතර බන්ධනාගාර සතු වාහන 34 ක ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් වර්ෂයකට අධික කාලයක සිට සිදුකර නොතිබුණි. |

**3.10 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**-------------------------------------------------------**

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**----------------------------------**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(අ) 2007 වර්ෂයේ දී ආරම්භ කර 2011 වර්ෂයේදී නිම කිරීමට සැලසුම්කර තිබුණු පල්ලෙකැලේ බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් 2502(1) වැය විෂයය යටතේ වාර්ෂිකව දිගින් දිගටම ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. නිසි සැලැසුමකින් තොරව ඉදිකිරීම් සිදු කිරීම හේතුවෙන් 2017 අගෝස්තු 31 දින වන විටත් වැඩ නිමකර නොතිබුණු ව්‍යාපෘතියේ ප්‍රමාදය නිසා සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණු රු.මිලියන 1,927.04 ක ප්‍රතිපාදනවලින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1,285.05 ක් පමණක් වැය කර තිබුණි.

(ආ) වර්ෂ 2 ක් තුළදී නිමකිරීමේ පදනම මත 2014 වර්ෂයේදී පිළියෙල කර තිබුණු රු.මිලියන 37 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුවක් සහිත බන්ධනාගාර කාර්යාල මූලස්ථාන ගොඩනැගිල්ලේ රු.මිලියන 30 ක් දක්වා වූ වැඩ කොටස් ඉටු කිරීම සඳහා රජයේ සංස්ථාවක පරිපාලිත සමාගමක් වෙත ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටියෙන් බැහැරව ප්‍රදානය කර තිබුණි. ලංසු ඇපකර හා කාර්යසාධන ඇපකර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයෙන් එම සමාගම නිදහස් කිරීමටත් අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව එම සමාගම වෙත රු.මිලියන 37.3 ක් දක්වා වැඩ පිරිනමා තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 6.04 ක් ගෙවා තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 2.84 ක් ආපසු අයකර ගෙන නොතිබුණු නමුත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සඳහා ඉදිරිපත් කර තිබුණු ඇපකරය 2017 පෙබරවාරි 10 දින කල් ඉකුත් වී තිබුණි.

2017 අගෝස්තු 31 දින වන විට කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 9.74 ක් ගෙවා තිබුණු අතර වර්ෂ 2 ක් තුළදී නිමකිරීමේ පදනම මත 2014 වර්ෂයේදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු නමුත් 2017 අගෝස්තු 31 දින වන විටත් ගොඩනැගිල්ලේ භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

**3.11 අවිධිමත් ගනුදෙනු**

**----------------------**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපරිපාටියෙන් බැහැරවීම**

**--------------------------------------------------------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමෙන් තොරව බන්ධනාගාර මූලස්ථානය සඳහා රු.මිලියන 1.99 ක් වැයකර පොත් රාක්ක 100 ක් හා අගුණකොලපැලැස්ස බන්ධනාගාරය සඳහා රු.මිලියන 1.10 ක් වැයකර මෙට්ට 300 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) අධිකාර බලය නොතිබුණු ගනුදෙනු

-------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියෙන් බැහැර වීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන, බන්ධනාගාරයට පුහුණු පාසලක් මාතර කොටවිල වත්ත ප්‍රදේශයේ ඉදිකිරීමේ රු.මිලියන 27.26 ක් වූ කොන්ත්‍රාත්තුව කාර්යසාධන ඇපකරයක් ලබා ගැනීමකින් තොරව 2014 සැප්තැම්බර් 19 දින රාජ්‍ය සංස්ථාවකට ප්‍රදානය කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 15.99 ක් ගෙවා තිබුණු අතර එදින සිට කොන්ත්‍රාත්තුවේ වැඩ අත්හැර දමා තිබුණි. ගොඩනැගිල්ලේ වහලය සෙවිලි නොකිරීම නිසා වහලයේ හා ඉහළ මහලේ ස්ථාපිත යකඩ කාප්ප හා ඉහල මහලේ කොන්ක්‍රීට් තට්ටුව දිරාපත් වෙමින් පැවතුණි. එසේම ගොඩනැගිල්ලේ අභ්‍යන්තර කාමර තුළ ජලය විශාල ලෙස එකතුවී මදුරු කීටයන් බෝවී තිබීමත්, පාසි බැදීමත්, ඉඩම වල් බිහිවී පැවතීම නිසා හරකුන් වැනි සතුන් ලැගුම් ගෙන තිබීමත් නිරීක්ෂණය විය.

## 3.12 පාඩු හා හානි

----------------

ඉකුත් වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාලපරාසය තුළ සිදුවී තිබුණු වාහන අනතුරු 153 කින් හා කැරලි කෝලාහල 04 කින් සිදු වී තිබුණු මුළු අලාභය රු.මිලියන 34.17 ක් වී තිබුණි. වටරැක බන්ධනාගාරයේ 2013 වර්ෂයේදී භාණ්ඩ තොගයක් කල් ඉකුත්වීම නිසා සිදුවූ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තක්සේරු නොකරන ලද අලාභයන් හා සමාලෝචිත වර්ෂයේදී සිදුවී තිබුණු තක්සේරු කර තිබුණු මුළු අලාභය රු.මිලියන 2.52 ක්වූ වාහන අනතුරු 18 ක් සම්බන්ධයෙන්ද, මුදල් රෙගුලාසි 103, 104, හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඉන් සමාලෝචිත වර්ෂයේදී සිදුවී තිබුණු අලාභ මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයේ සටහන් කිරීමටද කටයුතු කර නොතිබුණි. තවද 2016 ඔක්තෝබර් 16 දින වැලිකඩ බන්ධනාගාරය සතු වාහනයක් අනතුරට පත්වීම හේතුවෙන් සිදු වී තිබුණු අලාභය රු.340,312 ක් අඩුවෙන් හානි පිළිබඳ ලේඛනයේ සටහන් කර තිබුණි.

## 3.13 අනාර්ථික ගනුදෙනු

-----------------------

එදිනෙදා බන්ධනාගාරගත වන රැඳවියන් ලියාපදිංචි කිරීම හා දැනට රඳවා ඇති රැඳවියන් 30,000 ක පමණ තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම අරමුණු කර ගනිමින්, ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 85 ක් වූ තොරතුරු කළමණාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළදී රු. මිලියන 99 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම තොරතුරු පද්ධතිය පරීක්ෂණ මට්ටමින් ක්‍රියාත්මක කිරීම වැලිකඩ බන්ධනාගාරය තුළ ආරම්භ කර තිබුණු අතර පද්ධතිය මිලදී ගැනීමට හා වැලිකඩ බන්ධනාගාරය තුළ පමණක් ස්ථාපිත කිරීමට 2016 නොවැම්බර් 30 දින වන විට වැයකර තිබුණු මුළු මුදල රු.මිලියන 38.33 ක් විය. නමුත් පද්ධතිය සැලැසුම් කිරීමේ දූර්වලතාවයන්, ජාල ගත නොකිරීම සහ විධිමත් පරිදි අන්තර්ජාල පහසුකම් ලබා නොගැනීම හේතුවෙන් 2017 අගෝස්තු 31 දින වන විටත් පද්ධතිය විටින් විට බිඳවැටීම්වලට ලක් වෙමින් යථා පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවන තත්ත්වයක් පැවතියදී රු.මිලියන 3.06 ක රැඳවුම් මුදලින් සියයට 89 හෙවත් රු.මිලියන 2.74 ක් 2016 දෙසැම්බර් 16 දින වන විට කොන්ත්‍රාත්කරු වෙත ආපසු ගෙවා තිබුණි.

**3.14 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මහර බන්ධනාගාරයේ විනය පරීක්ෂණ ඇතුළත් වාර්තා පොත 2013 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබු අතර එම වර්ෂයේ සිට යොමු කර තිබුණු විනය පරීක්ෂණ 214 කින් අවසන් පරීක්ෂණ වාර්තා 13 ක් පමණක් භාරදී තිබුණි.

(ආ) කර්මාන්ත අංශයන්හි සේවයේ නියුතු නේවාසිකයිගේ සිර වේතන සංශෝධනය සඳහා බන්ධනාගාර ජනරාල් විසින් පත්කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ නිර්දේශය මත සිර වේතන සංශෝධනය සඳහා අමාත්‍යාංශයේ ලේකම් විසින් 2013 දෙසැම්බර් 31 දින අනුමැතිය ලබා දී තිබුණද, වර්ෂ 03 කට අධික කාලයක් එම රේටයන් සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) මහර බන්ධනාගාරයේ රියදුරන්ගේ ඉල්ලීම අනුව ඉකුත් වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේ දී මෝටර් රථ 03 ක් සඳහා මිලදී ගත් රු.240,858 ක් වටිනා ටයර් භාවිතයට නොගෙන ගබඩාවේ රඳවා ගැනීම හා ප්‍රමාද වී නිකුත් කිරීම හේතුවෙන් එම ටයර්වල වගකීම් කාලයෙන් වැඩි කාලයක් ගබඩාවේ නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2014 නොවැම්බර් 02 දින ආරම්භ කර තිබුණු මාතර පිටබැද්දර පුනරුත්ථාපන මධ්‍යස්ථාන භූමියේ පිහිටා ඇති අක්කර 07 ක කුඹුරු යායෙහි 2016 වර්ෂයේදී අස්වැන්න කිලෝ 3,680 ක් සහල් කර නේවාසිකයිගේ ප්‍රයෝජනය සඳහා ලබා දී තිබුණි. විගණන දිනය වූ 2016 දෙසැම්බර් 07 දින සිට 2017 සැප්තැම්බර් මාසය දක්වා මෙම කුඹුරු ඉඩමේ වගා කටයුතු අතහැර පුරන් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයේ දී මාතර බන්ධනාගාරයට අමු හා වියලි ආහාර සැපයුම්කරු විසින් සපයා තිබුණු ආහාර අතර මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු කැරටි, ගෝවා, හාල්මැස්සන්, තේ කුඩු හා මාලු තිබුණු බව මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සිදුකර තිබුණු පරීක්ෂණවලින් සනාථ වී තිබුණි. ඊට අමතරව සැපයුම්කරු සමඟ එළඹ තිබුණු ගිවිසුමට පටහැනිව, වෙළඳපල මිල ඉහල යාම නිසා සීනි සැපයීම සැපයුම්කරු විසින් නතර කර තිබුණ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.

(ඊ) බන්ධනාගාර නිත්‍ය නියෝග 653 හා 673 ඡේදවල දැක්වෙන විධිවිධානවලට පටහැනිව මහර බන්ධනාගාරයේ පැරණි ගොඩනැලිල්ලක් කඩා ඉවත් කිරීමට හා ඒ මත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රැඳවියන් යොදවා තිබුණු බැවින් රුඳවියන්ගේ ආරක්ෂාව තහවුරුවී නොතිබුණි.

**3.15** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 165 | 84 | 81 |
| (ii) | තෘතියික මට්ටම | 132 | 74 | 58 |
| (iii) | ද්විතියික මට්ටම | 7,154 | 5,683 | 1,471 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 371 | 322 | 49 |
| | එකතුව | 7,822 | 6,163 | 1,659 |